# ශ්‍රී ලංකා වෛද්‍ය සභාව

## පුරප්පාඩු

## කාර්යාල කාර්යය සහායක - කොන්ත්‍රාත් පදනම

ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ පවතින ඉහත තනතුරෙහි පුරප්පාඩුව සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**සුදුසුකම් සහ පළපුරුද්ද**

(i) අ.පො.ස සාමාන්‍ය පෙළ සිංහල/ දෙමළ භාෂාව සහ ඉංග්‍රීසි භාෂාව සහිතව අවම වශයෙන් විෂයයන් 6ක් සමත් වී තිබීම.

(ii) NVQ Level 2 හෝ ඊට වඩා වැඩි මට්ටමක සුදුසුකමක් ලබාතිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

(iii) විදුලි කාර්මික ශිල්පය හා ජල නල පද්ධති නඩත්තුව ඇතුළු ගොඩනැගිලි සුළු අලුත්වැඩියාවන් පිළිබඳ දැනුමක් පවතින අයදුම්කරුවන්ට විශේෂයෙන් සලකා බලනු ලැබේ.

**රැකියා විස්තරය**

පවරා ඇති ඒකකයේ ලේඛන ගොනු කිරීම, පණිවිඩකරුවෙකු ලෙස සේවය කිරීම, විදුලි දෝෂවලට විසඳුම් ලබාදීම, ජල නල පද්ධති නඩත්තුව ඇතුළු ගොඩනැගිලි සුළු අලුත්වැඩියාවන් හා පරිපාලන රාජකාරිවලට සහාය වීම යනාදිය සඳහා වගකීම දැරිය යුතුය. රාජකාරි භාරගැනීමේදී සවිස්තරාත්මක රැකියා විස්තරය භාරදීම සිදුවේ.

**බඳවා ගැනීමේ පටිපාටිය**

සම්මුඛ පරීක්ෂණය

**වයස් සීමාව**

2024.04.01 වන දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 35ට නොවැඩි විය යුතුය.

**වැටුප්**

සාකච්ඡා කළ හැකි අතර, සම්මුඛ පරීක්ෂණයේදී තීරණය වේ.

**කොන්දේසි**

මූලික පත්වීම වසරක් (01) සඳහා වන අතර, ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ අවශ්‍යතාවය හා කාර්යය සාධනය මත පදනම්ව ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ අභිමතය පරිදිකොන්ත්‍රාත් පදනම දීර්ඝ කිරීමේ හැකියාව ඇත.

ඉහත තොරතුරු සඳහා උනන්දුවක් දක්වන අයදුම්කරුවන් ඥාතීන් නොවන දෙදෙනකුගේ විස්තර සහිත තිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පතක් සුදුසුකම් සනාථ කරන අදාළ සහතිකවල ඡායා පිටපත් සමග 2024.04.01 වන දින හෝ ඊට ප්‍රථම ලියාපදිංචි තැපෑලෙන් පහත ලිපිනයට යොමු කළ යුතුය.

**අයදුම්පත් යොමු කරන ලිපි කවරයේ ඉහළ වම් කෙළවරෙහි කාර්යාල කාර්යය සහායක - කොන්ත්‍රාත් පදනම යන්න සඳහන් කළ යුතුය.**

**වෛද්‍ය එච්. ඞී. බී. හේරත්,**
**ලේඛකාධිකාරී, ශ්‍රී ලංකා වෛද්‍ය සභාව,**
**නො 31, නොරිස් කැනල් පාර, කොළඹ 10.**
**10.03.2024**